
# ඊළමට හොර පාරක් කපන ලකුණු

## මේ කුමන්ත්‍රණය වලකාලමු!


Robert Blake


Barak Obama


Hilary Clinton

**සූ**පුරුදු සෙල්ලම පටන්ගෙන ඇත!

පෙබරවාරි **5** වන දින ශ්‍රීලංකාවේ පළවන **Sunday Times** පුවත්පත මේ වගන්තිය ශීර්ෂපාඨය ලෙස ගෙන පළකර තිබුණි. **"US sends three envoys to assess Govt. initiatives on LLRC report".**

"උගත්පාඩම් වාර්තාව අධ්‍යනය කිරීමට සහ එය ක්‍රියාත්මක වන්නේදැයි සොයා බැලීමට ඇමරිකා එක්සත් ජනපදය නියෝජිතයින් තිදෙනෙකු ශ්‍රීලංකාවට එවයි."

දැනගන්නට ලැබී ඇති පරිදි පෙබරවාරි 27-මාර්තු 23 දක්වා ජිනීවාහි පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ 19 වන සැසිවාරයේ දී ඇමරිකාව ශ්‍රීලංකාවට එරෙහිව යෝජනාවක් සම්මත කරවීමට බලාපොරොත්තුව සිටී. එයටත් පෙර දැන්ම ම හිලරි ක්ලින්ටන් මූලිකත්වය ගෙන ප්‍රධාන නිලධාරීන් තිදෙනෙකු එවා ඇත. ඒ තිදෙන නම් මාරි ඔටේරෝ, රොබර්ට් බ්ලේක් (මොහු මීට කලින්ද ලංකාවේ හොල්මන් කළා ඔබට මතක ඇත.) සහ ස්ටීවන් රැප් යන අය වෙති.

මේ සියල්ල හිලරි ක්ලින්ටන් විසින් විශාල වැයමක් ගෙන කරනු ලබන්නේ ඇමරිකාවේ සිටින කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරාවේ හැලුණු කැලිවලට ඊළම් තනාගන්නට කරන උදව්වක් වශයෙනි. හිලරි ක්ලින්ටන් ජනාධිපති ධූරයට තරඟකළ අවස්ථාවේ ඒ කොටි හිතවාදී කැලි හිලරි දිනවන්නට විශාල වශයෙන් ප්‍රචාරක කටයුතු පමණක් නොව මුදල් ආධාරද කළ හැටි අපට මතක ය. හිලරි දැන් මේ කරන්නේ උන්ට කළගුණ සැලකීමකි.

එසේම මෙහිදී පෙනෙන තවත් දෙයක් නම් ඇමරිකාව හිටිවනම ශ්‍රීලංකාවට අදාළ ගෘහස්ත කාරණාවලට විශාල හදිසියකින් දුවගෙන ඇවිත් සොයාබලන්නට සැරසෙන බවයි. හේතුව අපට හිතාගත හැකි ය.

### අරාබි වසන්තය වගේම ආසියානු වසන්තයක් ගෙන ඒමේ වෑයමක්

ගිය අවුරුද්ද පුරා ඊජිප්තුවේ සිට යේමනය දක්වා අරාබි රටවල් වල කටයුතු වලට අතදමා ඒවා විසඳන නියාවෙන් ඒ ජන සමාජයන් විනාසකර, පාලනය කරගත නොහැකි අපහසු තත්වයට පත්කර, දැන් ඒ ක්‍රියාවලියම මේ අවුරුද්දේ දකුණු ආසියාවේ පටන් ගන්නටත් වසර මුලදීම එය ශ්‍රී ලංකාවෙන් අරඹන්නටත් ඔවුන් සිතා සිටින බව දැන් පැහැදිලිවම පෙනේ. එයට හොඳ ප්‍රවිශ්ඨයක්, වෙනත් අයුරකින් කිවහොත් ඇතුළට පැනගන්නට හොඳ අවස්ථාවක් උගත් පාඩම් වාර්තාව තුළින් සොයාගන්නට ඔව්හු බලාපොරොත්තු වෙති.

ශ්‍රීලංකාවේ යුද්ධය සිදුවූ අවසාන කාල සීමාවේ ඒ සටන් අවස්ථාවල උද්ගතවූ තත්වයන් උගත්පාඩම් වාර්තාවේ සාක්කි දුන් අය ඉදිරිපත් කළ කරුණු හා විස්තර තුළ ඇත්නම් එය මත මානව නීති උල්ලංඝනය කළ බවට යුද අපරාධ චෝදනා ශ්‍රී ලංකාවට ගෙන එන්නට පසුබිමක් තිබිය හැකියයි ඔවුන් විශ්වාස කරනවා විය යුතු ය. හදිසියේ ඇමරිකානු නියෝජිතයන් ලංකාවට එන්නට මූලික හේතුව එය මිස අන් කිසිවක් නොවේ.

අප මෙහිදී එම ඇමරිකානුන්ට පැහැදිලිවම පෙන්නා දිය යුත්තේ මෙයයි. එනම්:

**A.** උගත්පාඩම් කොමිසම් වාර්තාව **(LLRC Report)** යනු මෑත අතීතයේ අප රටේ, අප අතර සිදුවූ, අපට තේරුම්ගත හැකි, අපසමාජයේ සිදුවීම් ඇසුරෙන් එකතු කරගත්, අපේ අත්දැකීම් අනුසාරයෙන්, අපේ අඩු ලුහුඩුකම් සොයාබලා, අපේ ජනතාවගේ අනුදැනීම් මත, අපම පිළියෙළ කරගත්, අපේ ජනසමාජයේ විවිධ ජන කොටස් අතර අන්‍යෝන්‍ය සංහිඳියාව ඇති කිරීම සහ පවත්වාගෙන යෑම සඳහා සකස් කරගත්, අපේ අභ්‍යන්තර යාන්ත්‍රණයකි.

**B.** එම වාර්තාවේ කොටස් හෝ ඡේද හෝ විස්තර තැනින් තැනින් කඩා ඔසවා අර ගෙන, ඒවා බාහිර පුද්ගලයන්ට අවශ්‍ය පරිදි උන්ගේ අවශ්‍යතා ඉටුකරගැන්ම පිණිස පාවිච්චි කරන්නට ශ්‍රීලංකා රජය කිසිසේත් ඉඩ නොදිය යුතු ය.

**C.** උගත්පාඩම් ක්‍රියාත්මකවීම විය යුත්තේ එයට අවශ්‍ය කාලයක් ඇත්නම් ඒ කාලයට අනුව මිස එක් එක් අයට අවශ්‍ය පරිදි හැකි ඉක්මනින් හෝ සීඝ්‍රගාමී දියත්කිරීම් වලින් නොවේ. (මෙහි දී මතක්කර දියයුතු කාරණය නම් අප මේ පිළියම් යොදන්නට මහන්සි ගන්නේ දවසක් දෙකක් තුළ සිදුවූ දේවල් සඳහා නොව අවුරුදු 30 ක් පුරා සිදුවූ දේවල් පිරික්සමින් ඒ කාලය තුළ වූ වැරදි නිවැරදි කරගැන්මට ය. එය කඩිමුඩියේ කරන්නේ කෙසේද?)

### ඉරාකය, ඇෆ්ඝනිස්ථානය සහ ලිබියාව

අප මෙහිදී ක්ලින්ටන් කාන්තාවගෙන් කෙළින්ම ඇසිය යුතු ප්‍රශ්න මේවායි.

එනම් - උඹලාගේ ඇමරිකාව ඉරාකයේ මහා විනාශකාරී රසායනික ආයුධ ඇත කියාත්, සදාම් හුසේන්ගෙන් ඉරාක ජනතාව බේරාගැන්මට කියාත්, ඉරාකයට ඇමරිකානු හමුදාව යවා ඒ රටට එරෙහිව යුදවැදී අර කියූ භයානක ආයුධත් නැතුව, ඒ රටේ ගොඩනැගිලි නිවාස හා ජනසමාජය විනාශකර පැත්තකට වුණ නමුත් ඒ රට යථා තත්වයට පත්කරන්නට නුඹලා ගත් පියවරවල් මොනවාද? කොපමණ කලක් නුඹලාට ගතවුණාද? ඒ කියූ කිසිදෙයක් තවමත් සිදුවුණේ නෑ නේද?

ඇෆ්ඝනිස්ථානයට හෝ ලිබියාවට උඹලා කියන සාමය උදාකරවන්නට, ඒ රටේ බිඳුණු ජනසමාජය එකතුකරන්නට උඹලා ගෙන ඇති පියවරවල් මොනවාද? ඒවාට කොපමණ කලක් යාද?

උඹලා අළුතෙන් නිර්මාණය කළ **Ambassador for Global Criminal Justice** ඒ ප්‍රදේශවලට යවා ඒවා යථා තත්වයට පත් කරන්නට කටයුතු නොකරන්නේ ඇයි? ඒ කිසිවක් නොකර උඹලා ලංකාව පස්සේම පන්නන්නේ ඇයි ?

### රිප් වෑන් වින්කල් කතාන්තරය ද්‍රවිඩ ජාතික සන්ධානය සහ ශ්‍රී ලංකා රජය

මෙය බටහිර රටවල ජනප්‍රිය ඇමරිකානු ජනකතාවකි.

රිප් වෑන් වින්කල් නමැති කරුණාවන්ත ගම්වැසියෙක් තම බිරිඳගේ බැණුම් නෝක්කඩු ඉවසා සිටින්නට නොහැකිව, ඉන් මඳක් මිදී සිටීම පිණිස, දිනක් තම තුවක්කුව ද, බල්ලා ද කැටුව කඳු සහිත කැලෑවකට ඇවිදින්නට ගියේය. ඔහු එහිදී හමුවූ ඉන් පෙර දැක නැති මිනිසුන් කීප දෙනෙකු සමග ඔවුන් දුන් මත්පැන් වර්ගයක් පානය කළේය. අනතුරු වැටී නිදා ගත්තේය. ඇහැ ඇරී නැගිට බලන විට කිසිවෙකු අවට සිටියේ නැත. තමාගේ ශරීරයද හොඳටම මහලු වී ඇති බව ඔහුට පෙනිණ. තම බල්ලා ද අසලකවත් නොවී ය. ඔහුගේ තුවක්කුව දිරා මළකඩ කා තිබිණ.

ඔහු අමාරුවෙන් නැගී සිට ගාට ගාටා ගමට ගියේය. පුදුමයෙකි! ඔහු දන්නා හඳුනන කිසිවෙකු ඒ ගමේ සිටියේ නැත. සියල්ලෝ ආගන්තුකයෝ වූහ. විපරම් කර බැලූවිට ඔහුගේ බිරිඳ මියගොස් බොහෝ කලක් ගතවී තිබිණ. තමා දීර්ඝ කාලයක් නින්දට වැටී සිට ඇති බව රිප් වෑන් වින්කල්ට අවබෝධ විය.

**TNA** හෙවත් දෙමළ ජාතික සංධානය කරන දේවල් දෙස බැලූවිට සිහියට එන්නේ ඉහතකී රිප්වෑන් වින්කල් ජනකතාවය. ඔවුන් හැමදාම පුනරුච්චාරණය කරන ඔවුන්ගේ කෙහෙල්මල් **ජාතික ප්‍රශ්නය** හමුවේ ඔවුන් තවම ජීවත් වන්නේ අතීතයේ ය. දැනට අවුරුදු ගණනක් ගතවී වෙනත් යුගයකට පැමිණ ඇති බව ඔවුනට හැඟෙන්නේ නැත. ඔවුන් ළඟ තවම තිබෙන්නේ අර නෝර්වීජියානුවන් ඇඟිළි ගැසූ සටන් විරාම කාලයේ නිතර කතා කළ බලය බෙදාදීම, පොලිස් ඉඩම් බලතල, උතුර හා නැගෙණහිර යාකිරීම ආදී බහුබූත අදහස් පමණය. පරණ බෙලෙක්ක තත්වයෙන් තවම ඔවුන් ඉදිරියට ඇවිත් නැති බව හොඳහැටි පෙනේ.

පුදුමයට කාරණය නම් දෙමළ සංධානය පමණක් නොව බලයේ සිටින අපේ අයද තවම ඉන්නේ රිප් වෑන් වින්කල් තත්වයේ ය. ඔවුන් ද දෙමළ සංධානය සමග තවමත් අර පරණ නෝර්වීජියන්කාරයින් සහ ඇන්ටන් බාලසිංහම්ලාගේ කාලයේ පට්ට ගැසූ උතුරු නැගෙණහිර බලය බෙදාදීම, පොලිස් බලතල දීම, ස්වයං පාලනයක් දීම ආදී බහුබූත සාකච්ඡාවල් කරන්නට තවම කැමැත්තෙන් සිටිනබව පෙනේ. තවම ප්‍රභාකරන්ලා, තමිල් චෙල්වම්ලා, නඩේසන්ලා උතුරේ ඉන්නවායයිද, යුද්ධය තවම යනවා යයි කියා ද රජයේ සමහරුන් හිතා ඉන්නවා ද කියා දන්නේත් නැත. එක්කෝ ඔවුන්ගේ සිහි විකල්ව ඇත්දැයි ද සැකයකි.

### යුද්ධය අවශ්‍යයයි කීවේ කවුද?

යුද්ධය පිළිබඳව සඳහන් කරන විට එය හඳුන්වන නිර්වචන මාලාව මෙයයි.

එනම් යුද්ධය යනු දෙපිරිසක් සාමයෙන් සාකච්ඡාවෙන් ප්‍රශ්නයක් විසඳන්නට ගොස් ඒ සියල්ල ව්‍යවර්ථ වූ විට, අසමත් වූ විට අවසානයේ ඇති එකම පියවර වශයෙන් යුද්ධයකට එළඹෙන බවයි. ප්‍රභාකරන් සහ එල්ටීටීඊ කොටි සංවිධානය ඊළම් **4** යුද්ධය ප්‍රකාශ කරන්නට පෙර ශ්‍රීලංකාවේ රජයයන් කීපයක්ම කොතෙක් නම් වතාවක් සාකච්ඡාවලට එකඟවන්නට ඇද්ද? යන්නට ඇද්ද? ඉන්දියාව ඔවුනට කොපමණ බලකරන්නට ඇද්ද? එහෙත් විසඳුම් කතාබහ සහ සාකච්ඡා ප්‍රතික්ෂෙප කොට යුද්ධය අවශ්‍යයයි කීවේ කවුද? ප්‍රභාකරන් සහ කොටි සංවිධානයයි. ඔවුන්ට ප්‍රදානය කළ ඒ හොඳ අවස්ථාවන් සියල්ලම **2009** මැයි මස ඒ මාරක දිනයේ ඔව්හු නන්දිකඩාල් කළපුවේ ගිල්වා දැමූහ.

දැන් ඉතින් අප ආපහු ද්‍රවිඩ සංධානය පසුපස්සේ යන්නේ ඇයි ?

දැන් අපට හොඳින් පැහැදිලිව පෙනෙන කරුණ නම් **TNA** දෙමළ සංධානය මේ නොයිවසිල්ලෙන් බලා සිටින්නේ කොටි සංවිධානයෙන් ඉතිරිව බටහිර රටවලට පැන සිටින ඇමරිකාවේ සහ යුරෝපයේ නව අධිරාජ්‍යවාදී රටවල ගැත්තන් බවට

## ඇමරිකාව නොකියා වගේ කියන්නේ මෙයයි...... "අපි අරාබිකරය විනාස කළා. දැන් ඊළඟට දකුණු දිග ආසියාව විනාස කරමු. ඒක අපි ශ්‍රී ලංකාවෙන් පටන්ගනිමු .....! "

**It looks as if US is suddenly in a big hurry to move to Sri Lanka on matters pertaining to that land.**

**May be they have finished with the Arab countries on matters like global criminal justice, in many Arab countries from Egypt to Yemen last year, with the 'Arab Spring' and now decided to move to bring their blessings to start a 'South Asian Spring' in the new year starting with us in Sri Lanka.**

**What we need to remind the US is this :**

**(a)** LLRC is our own internal mechanism to go onto what we gathered from our experiences of the recent past and take action appropriately on any omissions and commissions and to bring about reconciliation among parties involved.

**(b)** sections from the report cannot be picked up from here and there to meet motives of external groups

**(c)** It has to be a process taking its own time.(mind you we are trying to redress harm done in the course of 3 decades.

**We should ask Mrs Hilary Clinton:**

" How long has it taken the US to bring redress to people of Iraq where you moved in to save them from "weapons of mass destruction ? "

" How long will it take to bring peace and reconciliation in Afghanistan or Libya?


" Why aren't you sending your newly appointed Ambassador at large for Global Criminal Justice to do something about those places ? "

පත් කොටිහිතවාදී ඩයස්පෝරාව ඔවුන්ගේ උපක්‍රම යොදා ජිනීවාහි ශ්‍රීලංකාවට එරෙහිව කිසියම් දැඩි පියවරක් ගන්නට සලස්වනවා ඇත කියාය. දෙමළ ජාතික සංධානය එල්ටීටීඊයට සම්බන්ධව සිටි බව අපි දනිමු. දැන් ඔවුන් සම්බන්ධව ඉත්තන්වී සිටින්නේ එල්ටීටීඊය කඩා හැලී ඉන් විසිරී සිටින කැලි බැලි වලට ය. ශ්‍රීලාංකික ජනතාව සියළු දෙන ශ්‍රීලාංකිකයන් හැටියට එකමුතු වුනොත් දෙමළ සංධානයේ දේශපාලනයට පැවැත්මක් නැත. ඒ නිසා එසේ එකමුතුවීමට **( TNA )** දෙමළ සංධානයට අවශ්‍ය නැත.

### අප කළයුතු දේ

වර්තමාන ශ්‍රීලංකා රජය සියළු ජාතීන්හි සැබෑ එකමුතුකම අපේක්ෂාවෙන් ඉදිරියට යමින් ඒ සඳහා අවංකම බොහෝ සංවර්ධන කටයුතු ද, පුනරුත්ථාපන කටයුතු ද අරඹා, ඒවා ක්‍රියාත්මක කරගෙන යන බව අපි අද පැහැදිලිව දකිමු.

අපේ රජය මේ කරුණු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට **(UNHRC)** පෙන්නා දිය යුතුය. එසේම එහිදී ඇමරිකාව සහ දැන් බංකොලොත් භාවයට වැටුණු දිරාගිය බටහිර රටවල්ද කොටි ත්‍රස්තයින්ගේ ඉතිරි කැලිවල අතකොලු බවට පත්වී අප කරන හොඳවැඩ සියල්ල කඩාකප්පල් කරමින් රට නැවත අගාධයට දමන්නට සැරසෙන බව ද එම කොමිසමට මනාසේ පැහැදිලි කළ යුතු ය.



♦ වකුල ගුණපාල
Wakula Gunapala
Ilford Essex UK